# අන්තර්ජාතික අපරාධවලට සම්බන්ධවීමෙන් වැළකී සිටීමේ පියවර




NIS 대한민국 국가정보원




## කොරියානු ජනරජය තුළ විදේශිකයන් විසින් සිදු කරන අපරාධ සංඛ්‍යාව වැඩි වෙමින් පවතී.

මිලියන **2.5**කට අධික විදේශ ජාතිකයන් කොරියානු ජනරජයේ වෙසෙන අතර, විදේශ ජාතිකයන් විසින් සිදුකරන ලද අපරාධ සංඛ්‍යාව පසුගිය වසර පහ තුළ ගත්කළ වසරකට සාමාන්‍ය අගය **36,000** ක් පමණ වේ. මේ අතර, අත්අඩංගුවට ගත් බොහෝ විදේශීය ජාතිකයන් කියා සිටියේ රටේ නීතිය සහ නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පූර්ණ අවබෝධයක් නොමැති නිසා ඔවුන් අපරාධවලට සම්බන්ධ වී ඇති බවයි. එය මනසේ තබා ගනිමින්, කොරියානු ජනරජයේ වෙසෙන විදේශිය ජාතිකයන් පහසුවෙන් සම්බන්ධ විය හැකි ජාත්‍යන්තර අපරාධ සහ එම අපරාධ සිදුවීම වැළැක්වීමේ පියවරයන් පිළිබදව අපි බලමු.

# කොරියානු ජනරජයේ වෙසෙන විදේශීය ජාතිකයින් පහසුවෙන් සම්බන්ධ වන්නේ කුමන ආකාරයේ අන්තර්ජාතික අපරාධවලටද?

"ඔබ කොරියානු ජනරජයේ නීති සහ නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැන නොසිටියද, ඔබ දඬුවම් වලින් නිදහස් නොවේ."



## මත්ද්‍රව්‍ය භාවිතය

ගංජා පානය කිරීම යනු කොරියානු ජනරජයේ මත්ද්‍රව්‍ය අපරාධයකි.

## දුරකථන ඇමතුම් මගින් කෙරෙන මූල්‍යමය අපරාධ

වෙනත් පුද්ගලයින්ගේ ඉල්ලීම පරිදි මූල්‍ය ආයතනයකින් හෝ ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගැනීම භයානකය.

## ක්‍රෙඩිට් කාඩ් වංචාව

අන් අයගේ ක්‍රෙඩිට් කාඩ්පත් වලින් භාණ්ඩ මිලදී ගැනීමට ඉල්ලා සිටියහොත් ඒ පිළිබඳ නැවත සලකා බැලිය යුතුය.

## නීති විරෝධී සූදුව

කොරියානු ජනරජයේ සූදුව සහ පෞද්ගලික ලොතරැයි ඇදීම නීති විරෝධීය.



# Major Cases

01

ග්යොංගි පළාතේ හ්වාසොං ප්‍රදේශයෙහි සිල්ලර වෙළඳ සැලක් පවත්වා ගෙන "A" නමැති විදේශීය ජාතිකයෙකුගෙන් එම ජාතියේම විදේශීය පාරිභෝගිකයෙක් ඉල්ලා සිටියේ එම විදේශීය පාරිභෝගිකයාගේ නිවසේ සිට එවන ලද ජාත්‍යන්තර පාර්සලයක් "A" නමැති විදේශීය ජාතිකයාගේ සිල්ලර වෙළඳ සැලට බාරගන්නා ලෙසය.

කෙසේ වෙතත්, එම පාර්සලයේ පෙති වර්ගයේ මත්ද්‍රව්‍යයක් වන "යාබා" අඩංගු බව සොයාගත් හෙයින් "A" නමැති විදේශීය ජාතිකයාගෙන් ප්‍රශ්න කරන ලදී.

02

සෝල් හි රැකියාවක් සොයමින් සිටයදී, ‘B’ නමැති විදේශීය ජාතිකයාට වෙනත් ඉල්ලුම්කරුවකු වෙනුවෙන් මූල්‍ය ගිණුමකින් මුදල් ලබාගෙන එය වෙනත් ගිණුමකට මාරු කිරීමේ යෝජනාවක් ලැබුණි.

මුළු ප්‍රේෂණ මුදලින් සියයට එකක් කොමිස් මුදලක් ලෙස ලබා දෙන බව ‘B’ තැනැත්තාට දන්වන ලදී. ‘B’ තැනැත්තා සෝල් නුවර 00 බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් (ATM) මුදල් ලබා ගැනීමට උත්සාහ කළ අතර එහිදී ඔහු පොලිස් අත්අඩංගුවට ගනු ලැබුවේ දුරකථන ඇමතුම් මගින් මූල්‍යමය අපරාධ කෙරෙන කණ්ඩායමක සාමාජිකයෙකු ලෙසය.



# Major Cases

03

‘C’ නමැති විදේශීය ජාතිකයා කොරියාවට ඇතුළු වී මාසයක කාලයකට පසුව ඉන්චොන් හි දී අත්අඩංගුවට පත් වූයේ කෘතිම කැනබිනොයිඩ් (ගංජා) වර්ගයක් වන “ස්පයිස්” නමැති මත්ද්‍රව්‍ය  නොසැලකිලිමත් ලෙස ලග තබා ගැනීම හේතුවෙනි.

එසේම, උතුරු ග්යොංසොං පළාතේ සියොංජු හි ‘D’ නමැති විදේශීය ජාතිකයා දඩුවම් ලැබුවේ සිය සේවා ස්ථානය ඉදිරිපිට කන්දක් තුළ ගංජා වගා කිරීම සහ ගංජා පානය කිරීම සම්බන්ධයෙනි.

04

ග්යොංගි පළාතේ ඕසාන් ප්‍රදේශයේ ‘E’ නමැති විදේශීය ජාතිකයා හට, කොරියානු ජනරජයේ ජීවත්වන එම ජාතියේම විදේශිකයන්ට වසර ගණනාවක සිට පෞද්ගලික සූදු පොළක් පවත්වාගෙන යාම වෙනුවෙන් දැඩි දඩුවම් නියම විය. එය ඔහුගේ රටෙහි ජයග්‍රාහී ලොතරැයි අංකයට ලැබෙන ත්‍යාග මුදල මෙන් 70 ගුණයක් විශාල මුදලකි.





## කොරියානු ජනරජයේ දී ඔබට දඩුවම් ලැබීමෙන් පසු, ඔබට නැවත රට තුළට ඇතුළු වීමට අපහසු වනු ඇත.

ඔබගේ අනුදැනුමකින් තොරව ඔබ අපරාධයකට සම්බන්ධ වුවද, ඔබ රට තුළ දඩයකට හෝ සිරගත කිරීමකට මුහුණ දුන්විට ඔබට රටින් පිටවීමට සිදුවන අතර බොහෝ විට නැවත රටට ඇතුළු වීමට ඉඩ නොදේ.

එමනිසා, ඉහත සදහන් සිද්ධීන් වලට සම්බන්ධ නොවීමට ඔබ සැලකිළිමත් විය යුතුය.

# අපරාධ වලක්වා ගත හැකි ක්‍රම



**01** අන් අය වෙනුවෙන් පාර්සලයක් හෝ අයිතමයක් ලබා ගැනීම හෝ රැගෙන යාම නොකරන්න. එහි මත්ද්‍රව්‍ය අඩංගු විය හැකිය.

**02** ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් (ATM) විශාල මුදලක් ලබා ගන්නා විට ඔබට කොමිස් මුදලක් ලබා දෙන බවට කරන යෝජනා වලට එකග නොවන්න. බොහෝ විට එම යෝජනා දුරකථන ඇමතුම් මගින් කෙරෙන මූල්‍යමය අපරාධ වේ.

**03** ඔබ අන් අයගේ ක්‍රෙඩිට් කාඩ් වලින් වෙනත් පුද්ගලයකුට සුඛෝපභෝගී භාණ්ඩ හෝ වටිනා ආභරණ මිලදී නොගන්න. බොහෝවිට එම ක්‍රෙඩිට් කාඩ්පත් ව්‍යාජ ඒවා වියහැකිය.

**04** ඔබ ඔබගේ මිතුරන් සමග සෙල්ලම් කළද, සූදුව නීති විරෝධීය. කොරියානු ජනරජයේ සූදුව සහ පෞද්ගලික ලොතරැයි ඇදීම දැඩි දඬුවම් වලට යටත් වේ.


කොරියානු ජනරජය තුළ ඔබගේ ජීවිතය ආරක්ෂිත
සහ අන්තර්ජාතික අපරාධ වලින් තොර යැයි සිතමු!
අන්තර්ජාතික අපරාධ පිළිබඳ වාර්තා කිරීමට 111 අමතන්න
111
NIS 대한민국 국가정보원

## 한국 체류 외국인들이 주로 **연루되는 국제범죄**는?

**The most common transnational crime that foreigners in korea get involved is...**

කොරියාවේ විදේශිකයන් විසින් සිදු කරනු ලබන බහුලව දක්නට ලැබෙන අපරාධ නම්........

**마약** Illegal drugs
한국에서는 대마 흡연도 마약범죄
නීති විරෝධී මත් ද්‍රව්‍ය

**보이스피싱** Vishing
타인의 지시로 현금을 인출하는 것은 위험
දුරකථන මගින් සිදු කරන මූල්‍ය අපරාධ

**위조 신용카드** Credit card fraud
타인 카드로 물품 구매 부탁은 의심 필요
ක්‍රෙඩිට් කාඩ් වංචාව

**불법 도박** Gambling
한국에서 도박이나 사설 복권은 불법
සූදුව



"한국 법과 제도를 몰랐다고 해도 **처벌받습니다.**"

කොරියානු නීතිය සහ නියාමනය පිළිබද ඔබ නොදැන සිටියද, වරද සදහා ඔබට දඩුවම් ලැබෙනු ඇත.

You will still be punished even if you were not aware of Korean law and regulation

---

**국제범죄 피해없는**
**안전한 한국 생활을 기원합니다.**

**We wish for harmless and safe life in Korea with zero transnational crime**

අපරාධ වලින් තොර කොරියාවේ ආරක්ෂිත ජීවිතයක් සඳහා අපි පතමු.

**국제범죄 피해**
**신고 · 상담 전화**
Call 111 for transnational crime report
# 111

ජාත්‍යන්තර අපරාධ පිළිබද දැනුම් දීමට 111 අමතන්න



---

한국 체류 외국인들을 위한

# 국제범죄 연루 예방법

**How to not to get involved in transnational crime**

ජාත්‍යන්තර අපරාධ හා සම්බන්ධ වීමෙන් වළකින්නේ කෙසේද!



HRDK 한국산업인력공단
KOREA SUPPORT CENTER FOR FOREIGN WORKERS 한국외국인노동자지원센터
국가정보원

---

කොරියාවේ විදේශිකයින් විසින් සිදු කරන අපරාධ වැඩි වෙමින් පවතී.

## **한국 체류 외국인**들의 **범죄**가 늘어나고 있습니다.

**Crime by foreigners in Korea is increasing**




한국 체류 외국인의 규모가 200만명을 넘어서며 지난 5년간 외국인범죄도 연평균 3만6천여명에 이릅니다. 한편 검거된 외국인들 다수가 한국의 법과 제도 등을 잘 이해하지 못해 범죄에 연루됐다고 합니다.

이에 한국 체류 외국인들이 주로 연루되는 국제범죄와 그 예방법에 대해 알려드리겠습니다.

Let me show you the most common transnational crime and its' prevention

වඩාත් ප්‍රචලිත ජාත්‍යන්තර අපරාධ සහ ඒවා වැළැක්වීමේ ක්‍රමෝපායන්........